අ.පො.ස උසස් පෙළ

# පෙරදිග සංගීතය



## සංගීතය හඳුන්වන විවිධ නිර්වචන

# පෙරදිග සංගීතය

## සංගීතය හඳුන්වන විවිධ නිර්වචන

සංගීතය වූ කලී ස්වර ආධාරයෙන් ලියනු ලබන, ගායනා කරනු ලබන හා වයනු ලබන මිහිරි නාද සංකලනය වන අතර එය විශ්ව භාෂාවකට සමානය.

" **සංගීතය**" පිළිබඳව විවිධ දාර්ශනිකයින් විවිධ අර්ථ කථන ඉදිරිපත් කර ඇත.

### විෂය නිර්දේශයෙහි ඇතුලත් නිර්වචන

" ගීතං වාද්‍යං තථා නෘත්‍යං - ත්‍රයං සංගීත මුච්‍ය තේ"

" ගායනය, වාදනය හා නැටීම යන කරුණු තුනේ ක්‍රමානුකූල එක්වීම. "

සාරංග දේව - සංගීත රත්නාකරය

" ගීත වාදිත්‍රනෘත්‍යානං - ත්‍රයං සංගීත මුච්‍යතේ

ගාන ස්‍යාත්‍ර ප්‍රධානත්වාත් - තත් සංගීත මුදරිතම් "

" සංගීතයේ ප්‍රධානත්වය ගායනයයි. "

සංගීත පරිජාත

" ගීන නාදේන විනා ගීතං - නනාදේන වීනා ස්වරං

නා නාදේන විනා නෘත්‍යං - තස්මාත් නාදාත්මකං ජගත්"

" නාදයෙන් තොර ගීතයත් - නාදයෙන් තොර ස්වරයත් නාදයකින් තොර නැටුමකුත් නොමැති වන අතර ඒ සියල්ල නාදය ආත්ම කොට ගෙන ඇති බවය."

බෘහද්දේශී - මාතංග මුනි පඬිවරයා

අන්තර්ගතය - එන්.එල්. ධර්මදාස, උපගුරු, කු/ සර් ජෝන් කොතලාවල ම.ම.වි. කුරුණෑගල.

සැකසුම - ජී.ඩී.සී.එන්. ගමගේ මෙය - මො/මල්ලවත්තාවල ජාතික පාසල, වැල්ලවාය

Copyright © e-thaksalawa.moe.gov.lk

# පෙරදිග සංගීතය

" ස්වරයන්ගේ සම්‍යක්යෝගය ස්වරයන් මනා කොට යොදා ගැනීම සංගීතයයි. සමූහ වශයෙන් ගැයීම හා යහපත් ගීතයද සංගීතයයි."

බෘහද්දේශී - මාතංග මුනි පඬිවරයා

" ස්වරයන්ගේ සම්‍යක්යෝගය ස්වරයන් මනා කොට යොදා ගැනීම සංගීතයයි. සමූහ වශයෙන් ගැයීම හා යහපත් ගීතයද සංගීතයයි."

භාරතීය විචාරකයෝ

" රිද්මය හා තාලය පිළිබඳව ඇති අවදි බව පුද්ගලයාගේ අභ්‍යන්තරයට ඇතුළත් ව ආත්මය මනාව හැඩ ගැසීමට උපකාරී වන බැවින් සංගීතය පුහුණුව අන් සියල්ලටම වඩා වැදගත්ය."

ප්ලේටෝ

" මනා සංගීතය මිනිසාගේ ආත්මයට කථා කරන භාෂාවයි. එය මිනිස් හදවතේ ඇති උත්තුංග වූ භාවයන් ප්‍රබෝධමත් කරවීමේ ලා සමත් සදාචාරාත්මක හා සංස්කෘතික ව්‍යවසායකයන්ගේ නියම ප්‍රතිඵල ලබා ගතහැකි නාද මාධ්‍යය සංගීතය නැමැති යෝධ උද්වේගී ශක්තියයි.

මැක්ස් වේල හේස්

" හැඟීම් හෝ ආවේගයන්ට බලපාන ලෙස කටහඬින් හෝ සංගීත භාණ්ඩ මඟින් රිද්මය හා තනුව හා ස්වර සුසංයෝගයයි."

Universal English

අන්තර්ගතය - එන්.එල්. ධර්මදාස, උපගුරු, කු/ සර් ජෝන් කොතලාවල ම.ම.වි. කුරුණෑගල.

සැකසුම - ජී.ඩී.සී.එන්. ගමගේ මෙය - මො/මල්ලවත්තාවල ජාතික පාසල, වැල්ලවාය

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# පෙරදිග සංගීතය

" සංගීත් යන වචනය සැකසී ඇති අන්දම විග්‍රහ කරමින් " සං " යන උපසර්ගයට " ගීත් " යන වචනයට ගීත් යන ශබ්දය එක් වී (සං + ගීත් ) යන පදය සැකසී ඇති බව කියවේ. " සං " යන උපසර්ගයන් එක්ව මනා, යහපත්, සමූහ වැනි අර්ථ කියවේ. ගීත් යනු ගායනයයි. ඒ අනුව මනා ගායනයට, සමූහ ගායනයට සංගීතය යැයි කිව හැක.

හැඟීම් ප්‍රකාශනය කිරීම සඳහා ද රමණීය නාද රූප බිහි කිරීම සඳහා ද නාදයන් සංයෝජනය කිරීමේ කලාව සංගීතයයි."

ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය

මීට අමතරව ඔබගේ වැඩිදුර දැනුම සඳහා නිර්දේශිත නිර්වචනයන්ට අමතරව පහත නිර්වචනයන් ද ඉදිරිපත් කරමු.

"ස්වර හා ලය යන දෙක ක්‍රමානුකූල ස්වරූපයක් ගන්නා විට එක කලාවක් උපදී. එයට අප සංගීතය Music නැතහොත් මෝසිකි යැයි කියමු. "

හින්දි විශ්වකෝෂය

"අතෝ ගීතං ප්‍රධානත්වාදත්‍රවභීධියතේ

සාම වේදාදි ගීතං සංජ ග්‍රාහ පිත් මහ "

සංගීත රත්නාකරය - සාරංග දේව

අන්තර්ගතය - එන්.එල්. ධර්මදාස, උපගුරු, කු/ සර් ජෝන් කොතලාවල ම.ම.වි. කුරුණෑගල.

සැකසුම - ජී.ඩී.සී.එන්. ගමගේ මෙය - මො/මල්ලවත්තාවල ජාතික පාසල, වැල්ලවාය

The National e-learning Portal for The General Education

Copyright © e-thaksalawa.moe.gov.lk

# පෙරදිග සංගීතය

එම ශ්ලෝකයට අනුව "නෘත්‍යය " යන්න වාද්‍යානුගතය. "වාදනය " ගීතානුවර්තය. නමුත් මෙහිදි "ගීතය" ප්‍රමුඛ වන බැවින් "සංගීතය" යන ශබ්දය ඒ සඳහා අපට භාවිතා කළ හැක.

( සංගීත සංහිතා - පි. 253)

ගායනය, වාදනය හා නර්තනය අංගත්‍රයෙහිම ප්‍රමුඛ ගුණය චමත්කාර රක්ති ගුණයයි. මෙම රක්ති ගුණයෙන් තොර වන කිසිදු දෙයකට " සංගීතය" යන වචනය භාවිතා නොකරයි.

සංගීත දර්පණ - දාමෝදර් පඬිවරයා

ගායනය, වාදනය හා නර්තනය අංගත්‍රයෙහිම ප්‍රමුඛ ගුණය චමත්කාර රක්ති ගුණයයි. මෙම රක්ති ගුණයෙන් තොර වන කිසිදු දෙයකට " සංගීතය" යන වචනය භාවිතා නොකරයි.

සංගීත දර්පණ - දාමෝදර් පඬිවරයා

ස්වරයන්ගේ නිසි යෙදුම නැතහොත් උචිත ප්‍රයෝගයට සංගීතය යයි කියනු ලැබේ.

සංගීත සංකල්පන - දයා රත්නසේකර

ස්වරෝංකො මිලනා සංගීත් කහතෙ හෛ -

ස්වරවල එක්වීම සංගීතයයි.

වර්තමාන සංගීතඥයන්

අන්තර්ගතය - එන්.එල්. ධර්මදාස, උපගුරු, කු/ සර් ජෝන් කොතලාවල ම.ම.වි. කුරුණෑගල.

සැකසුම - ජී.ඩී.සී.එන්. ගමගේ මෙය - මො/මල්ලවත්තාවල ජාතික පාසල, වැල්ලවාය

Copyright © e-thaksalawa.moe.gov.lk

Music is the art of the combining sound.

නාදයේ එක්වීම සංගීතයයි.

බටහිර සංගීතඥයන්

මේ අනුව සංගීතය යනු දීර්ඝ ඉතිහාසයක් ඇති සංකීර්ණ විෂයකි. ඒ හේතුවෙන් විවිධ යුග වලදී විවිධ දාර්ශනිකයන් අතරින් සංගීතය පිළිබඳව විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇත. එබැවින් එක් නිශ්චිත නිර්වචනයක් ඉදිරිපත් කළ නොහැකි අතර අනාගතයේදී ද තවත් නිර්වචන බිහි විය හැක.



අන්තර්ගතය - එන්.එල්. ධර්මදාස, උපගුරු, කු/ සර් ජෝන් කොතලාවල ම.ම.වි. කුරුණෑගල.

සැකසුම - ජී.ඩී.සී.එන්. ගමගේ මෙය - මො/මල්ලවත්තාවල ජාතික පාසල, වැල්ලවාය

Copyright © e-thaksalawa.moe.gov.lk